www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ජපානය පලමු පශ්චාත් යුධකාලීන ආරක්ෂක අමාත්‍යංශය ස්ථාපිත කරයි

## Japan establishes first postwar defence ministry

**ජෝන් චෑන් විසිනි**
**2007 ජනවාරි 19**

දෙවන ලෝක යුද්ධයෙන් පසුව ජපාන යුධවාදය නැවත ස්ථාපිත කිරීම කරා යන ගමනේ පලමු පියවර ලෙසට ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂ රජය ජනවාරි 09 දා එරටෙහි ප්‍රථම ආරක්ෂක අමාත්‍යංශය පිහිටුවීය. පෙරදී ආරක්ෂක ඒජන්සි මූලස්ථානය, නව ආරක්ෂක අමාත්‍යංශය ලෙස නම් කිරීමේ නිල උත්සවයට ජපාන අගමැති ෂින්සෝ අබේ සහ ආරක්ෂක අමාත්‍ය ෂුම්යෝ සහභාගී විය.

ආරක්ෂක අමාත්‍යංශය නැවත ස්ථාපිත කල ජපාන නායකයා ලෙස තමන් ආඩම්බර වන බව අබේ තම කතාවේදී ප්‍රකාශ කලේය. "මෙය පශ්චාත් යුධකාලීන රාජ්‍යයෙන් මතුවීමෙන් පසුව නව ජාතියක් ගොඩනැගීම කරා යන ගමනේ දැවැන්ත පියවරකැ"යි ඔහු පැවසීය. මෙම නම වෙනස් කිරීම සුළු කාරනයක් සේ පෙනුනද, එය දෙවන ලෝක යුද්ධය අවසානයේදී මිලිටරිය යොදා ගැනීම පිලිබඳව ජපානය මත පැටවුන සීමා ඉවත් කරගැනීමේ අබේගේ වැඩසටහනේ කොටසකි.

ජපාන ව්‍යවස්ථාවේ සාමවාදී වගන්තිවලට අනුව ජාත්‍යන්තර අර්බුද විසඳාගැනීමට යුද්ධය සහ මිලිටරි බලය යොදා ගැනීම අහිමි කෙරී ඇත. ජපානයේ සැලකිය යුතු සංඛ්‍යාවකින් සමන්විත මිලිටරිය ස්වයං-ආරක්ෂක බලකාය ලෙස නම් කරමින් පශ්චාත් යුධකාලීන සමයේ පිලිවෙලින් පැවති ආන්ඩු සාමවාදී වගන්තිය අද්දර ක්‍රියාත්මක විය. කෙසේවුවද, දැන් ජාතික අවශ්‍යතා සඳහා මිලිටරි ආක්‍රමන පාවිච්චිකරන්නට හැකි "සාමාන්‍ය ජාතියක්" බවට ජපානය පත් කෙරෙන ලෙසට ව්‍යවස්ථාව නැවත ලියන්නට අබේ සැලසුම් සකස් කරයි.

අගමැතිකම ජුනිචුරෝ කොයිසූමි ගෙන් ලබාගෙන හරියටම මාස හතරක් තුල බොහෝ දුරදිග යන ප්‍රතිපල ඇතිකරන පනත් බොහෝ ගනනක් අබේ දැනටමත් සම්මත කරගෙන ඇත. විපක්ෂයේ ජපාන ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ සහයෝගය සහිතව ආරක්ෂක අමාත්‍යංශය ස්ථාපිත කිරීමේ පනත නීතිගත කෙරුනේ ගිය වසරේ අවසානයේදීය. ඒ සමගම ජපානයේ පශ්චාත් යුධකාලීන අධ්‍යපන නීතිය සංශෝධනය කර පනතක් මගින් "ස්වදේශානුරාගී අධ්‍යපනය" නැවත පාසල් වලට හඳුන්වා දීමට ටෝකියෝවට බලය ලබාදුනි.

නොවැම්බරයේදී එ. ජ. පරිපාලනය හා සමානවම ජාතික ආරක්ෂක කවුන්සිලයක් ගොඩනැගීම විමර්ශනය කිරීම සඳහා අධ්‍යයන මංඩලයක් අබේ ආරම්භ කලේය. ජපාන ව්‍යවස්ථාවේ සාමවාදී වගන්ති ජාතික රහස් ඔත්තුසේවා ඒජන්සිය යුක්තිසහගත කිරීම පවා අපහසු කලේය. දැන් වන තෙක් විවිධ අමාත්‍යංශවල වෙනස් දෙපාර්තමේන්තුවලට සීමා වී තිබූ ජපාන ඔත්තුසේවා ජාලය ජාතික ආරක්ෂක කවුන්සිලය මගින් නීත්‍යානුකූල කෙරෙන අතර එය ව්‍යප්තකිරීමටද ඉවහල් වනු ඇත.

ඒ හා සමානවම ආරක්ෂක අමාත්‍යංශය ස්ථාපිත කිරීමෙන් ජපාන මිලිටරියේ දේශපාලන තත්වයද ඉහල ගියේය. සියවස් භාගයක් පුරා කැබිනෙට්ටුවෙහි දෙවනු ආයතනයක් ලෙසට අගමැති ආරක්ෂක ඒජන්සිය පාලනය කලේය. රාජ්‍ය අමාත්‍යවරුන්ගෙන් කෙනෙක් එහි අධ්‍යක්ෂක ජනරාල් ලෙස ක්‍රියා කලේය.

සම්පූර්න අමාත්‍යංශමෙන් නොව ප්‍රධාන තීරනයක් ගැන හදිසි කැබිනට් රැස්වීමක් කැඳවන්නට හෝ පාර්ලිමේන්තුවට පනත් ඉදිරිපත් කරන්නට ආරක්ෂක ඒජන්සියට බලයක් නොතිබුනි. මුදල් අමාත්‍යංශයෙන් වෙන් කෙරෙන අරමුදල් මත රැඳෙනවාට වඩා දැන් ආරක්ෂක අමාත්‍යංශයට මිලිටරි අයවැයක් ඉදිරිපත් කල හැක.

දිගු පරාස සහිත බෝම්බ හෙලන ගුවන්යානා, ගුවන්යානා වාහක හෝ න්‍යෂ්ඨික අවි වැනි ආක්‍රමනශීලී අවි ආයුධ තබාගැනීම ව්‍යවස්ථානුකූලව තහනම් වුවද ජපානය සතුව දැනටමත් භයානක මිලිටරියක් පවතී. එය නවීනතම යුද්ධායුධ වලින් සන්නද්ධ වන අතර ඉන් සමහරක් එ. ජ. ට වඩා දියුනු බව විශ්වාස කෙරේ. 260,000 ක පිරිසකින් සමන්විත ජපාන ස්වයං-ආරක්ෂක බලකාය (ස්.ආ.බ) දැනටමත් බොහෝ ප්‍රධාන යුරෝපීය

බලවතුන් හා ප්‍රමානයෙන් සමානය. ස්.ආ.බ. සතුව යුධ ගුවන් යානා 350 සහ යුධනැව් 160 හා සමගම යුධ ටැංකි 1000 සහ සන්නාහ රථ 1300 ඇත.

2005 හිදී ජපානයේ ආරක්ෂක අයවැය ඩොලර් බිලියන 45ට වැඩි වූ අතර එය ප්‍රංශය ජර්මනිය රුසියාව ට වඩා ඉදිරියෙන් පවතින ලෝකයේ විශාලතම ඒවායින් එකකි. යුධ වියදම් දල දේශීය නිෂ්පාදනයේ කොටසක් ලෙස සියයට 2.7 වන බ්‍රිතාන්‍යය සහ සියයට 1.93 වන ප්‍රංශය හා සැසඳීමේදී තවමත් සියයට 1ට වඩා අඩුවන අතර එය වැඩිදුර ප්‍රසාරනයට ඉඩ ලබාදේ.

දියුනු කාර්මික රටවල් සමග සැසැදූ විට නිලධාරීන්ට සොල්දාදුවන්ගේ වැඩිම අනුපාතය ඇත්තේ ටෝකියෝවේය. ස්.ආ.බ. පිරිස්වලින් සියයට 20ක් ලෙෆ්ටිනන්ට් හෝ ඊට ඉහල තනතුරු හොබවන අතර සියයට 55ක් කොමිසන් නොලත් නිලධාරීහු වෙති. දැනටමත් පවතින විශාල අනදෙන ව්‍යුහයක් සමග දශ ලක්ෂයක් කරා සිය හමුදාව වේගවත්ව ව්‍යාප්ත කරන්නට ජපානයට හැකි බවට යුධ විශ්ලේෂකයෝ තක්සේරු කරති.

ජපාන යුධවාදය නැවත ස්ථාපිත කිරීමේ හැකියාව 1930 හා 1940 ගනන් වලදී ජපානය විසින් කෲර ලෙස ආක්‍රමනය කරන ලද වෙනත් ආසියානු රටවල අවධානයට යොමු විය. එහි යුධකාලීන වාර්තාවෙන් පිලඹිඹු වන ආකාරයට ටෝකියෝ පොරොන්දුවල අවංකභාවය ගැන සැක ඇති බවට අනතුරු අඟවමින් ජපාන ආරක්ෂක ඒජන්සිය ඉහල තත්වයට ගෙනඒම ඊසානදිග ආසියාවේ බලතුලනය කඩාකප්පල් කිරීමක් ලෙසට චීනය එසැනින් විවේචනය කලේය.

ජපාන යුධ විරුවන් සැමරීමට යකුසුනි දේවස්ථානයට කොයිසුමි කල කුපිතකරවන සුලු සංචාරය නිසා පීඩනයට ලක්වුනු චීනය සහ දකුනු කොරියාව සමග සම්බන්ධතා වැඩිදියුනු කරන්නට අබේ උත්සාහ දරමින් සිටියේය. පිලිපීනයේ පැවැත්වුනු නැගෙනහිර ආසියා සමුළුවේදී අබේ චීන සහ කොරියානු නායකයින් සමග අතට අත දෙන අතරේදී ජපාන මිලිටරිය ඉහල තත්වයට ගෙනඒමේ ටෝකියෝවේ පියවර රාජ්‍යතාන්ත්‍රික ආතතීන් නැවතත් ඉක්මනින් උත්සන්න කල හැක.

චීන සහ කොරියානු විවේචන වලට ප්‍රතිචාර දක්වමින් අබේ නම වෙනස් කිරීමේ සුවිශේෂීතාවය ලඝුකොට දැක්වීය. ආරක්ෂක ඒජන්සිය නැවත නම් කිරීම මගින් ජපාන මිලිටරිය අනෙකුත් රටවලට තර්ජනයක් මතුනොකරන බව ඔහු ප්‍රකාශ කලේය. "කලාපය තුල සාමය සහ ස්ථාවරත්වය සඳහා දායකත්වය සැපයීමේ තම වගකීම එමගින් පිලිඹිඹු කෙරෙන බව" ඔහු පැවසීය. ආසියාවේ බිය සංකා සංසිඳවන්නට ඔහුගේ අර්ථ නිරූපනය ඉතා අඩු සේවයක් සපයනු ඇත.

ජපාන ආරක්ෂක ඇමති ලෙස පත් වී දින කීපයකට පසුව ෆුමියෝ ක්‍යුමා "ඉතා බලවත්" ජපාන හමුදා බලයක් ගොඩනැගීම සඳහා ආරාධනා කලේය. විබාහි යුධ අභ්‍යාසයකදී කතා කරමින් මෙම ගොඩනැගීම රටවටා වෙනස්වන ආරක්ෂක වාතාවරනයට අවශ්‍ය ප්‍රතිචාර දැක්වීමක් ලෙස ඔහු විස්තර කලේය.

ජපානයේ ප්‍රධාන කලාපීය තර්ජන ලෙස චීනය සහ උතුරු කොරියාව නම් කල 2006 ජපාන ආරක්ෂක ධවල පත්‍රිකාවෙහි ඇමති අදහස් කලදේ සටහන් කර තිබුනි.

චීනය දකුනු කොරියාව හා රුසියාව සමග දැනට මතභේද පවතින දූපත් ගනනාවක් ජපාන භූමි ප්‍රදේශයේ කොටසක් ලෙසත් එය කුපිත කරවන ලෙස ප්‍රකාශ කර සිටියේය. වෙනත් වචනවලින් පවසනවානම් ජපානයේ කලාපීය සහ ජාත්‍යාන්තර ප්‍රතිවාදීන්ට එරෙහිව එහි ආර්ථික හා උපායමාර්ගික උවමනාවල් සපුරා ගැනීම සඳහා ආක්‍රමනශීලී ලෙස බලය තහවුරු කර ගැනීමට ඉතා බලසම්පන්න මිලිටරියක් අවශ්‍ය වේ.

සෝවියට් සංගමයේ බිඳවැටීම හා සීතල යුද්ධයේ අවසානයට පසුව ජපාන ආන්ඩු යුධ හමුදා මත ඇති ව්‍යවස්ථානුකුල සීමා අවසන් කරන්නට නිරන්තරයෙන් බලපෑම් කර තිබේ. 1990-91 ගල්ෆ් යුධ සමයේදී එ. ජ.ය මූලික වූ මෙහෙයුම්වලට සහභාගීවීමට හමුදා යැවීමට නොහැකිව ජපානය විශාල පාඩුවක් වින්දේය. කෙසේවුවද 2001 දී කොයිසුමි බලයට පත් වන තුරු ජනගහනයේ පුලුල් ස්ථරවල පැවති බලවත් යුධවිරෝදී මනෝභාවයන් අභිභවා යාම පිලිබඳව දක්නට ලැබුනේ සුලු ප්‍රගතියක් පමනි.

ජපාන හමුදා විදේශයන්ට යැවීම අවසානයක් කරා තල්ලුකරන්නට බුෂ් පරිපාලනයේ ව්‍යාජ "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය" කොයිසුමි විසින් යොදා ගැනිනි. 2001 දී ඇෆ්ඝනිස්ථානයේ එ. ජ.ය මූලිකත්වය දුන් මැදිහත්වීමට සහයෝගය දීමට ඔහු ජපාන යුධනැව් පිටත්කර හැරියේය. 2003 දී පුලුල්ව පැතිරුනු මහජන විරෝධතාවය නොතකා එ. ජ.ය මූලිකත්වය දුන් ඉරාකය අත්පත් කරගැනීමේ කොටසක් ලෙසට " ප්‍රහාරක නොවන" ඉංජිනේරු අංශ පිටත්කර හැරීමට කොයිසුමි ක්‍රියා කලේය. එය දෙවන ලෝක යුද්ධය අවසානයෙන් පසුව සක්‍රිය යුධ කලාපයකට ජපානය හමුදා යැවූ පලමු වතාව විය.

ජනවාරි 14 දා යොමියුරි ෂිම්බුන් පත්‍රයේ ලිපියකට අනුව ජාත්‍යාන්තර සාමසාධක මෙහෙයුම් වල නිරත ජපාන හමුදා කටයුතු සඳහා දැනට පවතින නීති සැලකිය යුතු ලෙස වෙනස් කිරීමට ඉඩ ලබා දෙමින් ව්‍යවස්ථාව නැවත අර්ථකතනය කරන්නට අබේගේ ආන්ඩුව සලකා බලමින් සිටී. වර්තමානයේදී ආයුධ පාවිච්චිය ස්වයං-ආරක්‍ෂාව සඳහා පමනක් ඉතා දැඩි ලෙස සීමා කර ඇත. මෙම වෙනස්කිරීම් මගින් එක්සත් ජාතීන්ගේ දේපල ආරක්‍ෂාව සහ සිරකරුවන් පැනයාම වැලැක්වීම ඇතුලත්ව විවිධ අරමුනු සඳහා "සිද්ධියක් සිදුවීමට පෙර" (pre-emptively) වෙඩි තබන්නට සොල්දාදුවන්ට අවසර ලැබෙනු ඇත.

චීනයට එරෙහිව විශේෂිතවත් ජාත්‍යාන්තරවත් කලාපය තුල වඩා බලපෑම් සහිත භූමිකාවක් ජපානයට රඟදක්වන්නට එ. ජ. විසින් සක්‍රියව අනුබල දෙන ලදී. ජපාන නාවික හමුදාව, මතභේද පවතින දූපත් වටාත් අසල්වැසි සාගරයේත් සිය බලය පෙන්වීම උත්සන්න කර ඇත. පිරික්සුම් චන්‍ද්‍රිකා දියත්කිරීම හා එ. ජ. හා එක්ව ප්‍රේරක නාශක මිසයිල පද්ධතියක් හවුලේ වර්ධනය කිරීම ඇතුලත්ව ජපානයේ මිලිටරි යටිතල පහසුකම් බලගැන්වීම සඳහා උතුරු කොරියානු න්‍යෂ්ඨික වැඩසටහන, කොයිසුමි සහ අබේ දෙදෙනා විසින්ම දඩමීමා කර ගනු ලැබ තිබේ.

ජනවාරි 12 දා බ්‍රසල්ස්හි නැටෝ මූලස්ථානයේදී නැටෝ නායක සමුළුව ඇමතු ප්‍රථම ජපාන අගමැති බවට පත්වෙමින් තවත් සැලකියයුතු පලමු ක්‍රියාවක් අබේ ලේඛනගත කලේය. "ජාත්‍යාන්තර සාමය හා ස්ථාවරත්වය වෙනුවෙන් නම් ස්.ආ.බ. යොදා ගනිමින් විදේශ කටයුතු කරගෙනයාමට ජපන්නු තවදුරටත් කුලෑටි නොවනු ඇතැ"යි ඔහු ප්‍රකාශ කලේය.

අබේගේ නිවේදනය, සිය ආර්ථික හා උපායමාර්ගික එල්ලයන් සපුරාගැනීමට මිලිටරිබලය පාවිච්චි කිරීම සඳහා අනෙකුත් අධිරාජ්‍යවාදී බලවේග හා ජපාන පාලක පන්තිය එක්වන බවට කල විවෘත ප්‍රකාශනයකි. අවසානයේදී කිව හැක්කේ "සාමය" හා "ස්ථාවරත්වය" සැමවිටම ආක්‍රමනකාරී කොල්ලකාර යුද්ධ දියත්කිරීම සඳහා තත්වය සකසන සම්මත බවට පත්ව ඇති බවයි.

© www.wsws.org